නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

# ධම්මානුස්සති භාවනාව

> "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ
> ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී'ති"

**1). <u>ස්වාක්ඛාත</u> :-** ශ්‍රී සද්ධර්මය මනාකොට දේශිත බැවින් ස්වාක්ඛාත නම් වේ. මෙම ගුණයට පර්යාප්ති හෙවත් උගත මනා බණ දහම් සියල්ලම, එනම් නවාංග ශාස්තෲ ශාසනය (ත්‍රිපිටක බුද්ධ වචනය) ද නව ලෝකෝත්තර ධර්මය ද ඇතුළත් වේ. සෙසු ගුණ පහෙන් කියැවෙන්නේ ලෝකෝත්තර ධර්මයෙහිම ගුණ ය. නව ලෝකෝත්තර ධර්ම නමින් හැඳින් වෙන්නේ සෝතාපන්න ආදි සතර මාර්ග, ඵල සතර හා නිවන ය.

පර්යාප්ති ධර්මය මුල - මැද - අග යහපත්ව (ආදිකල්‍යාණ, මජ්ඣේකල්‍යාණ, පරියෝසානකල්‍යාණ) දේශිත බැවින් ද අර්ථ ව්‍යඤ්ජනයෙන් පිරිපුන්ව පිරිසිදු බඹසර ප්‍රකාශිත වන බැවින් ද පර්යාප්ති ධර්මය <u>ස්වාක්ඛාත</u> නම් වේ. [පර්යාප්ති ධර්මයෙහි ස්වාක්ඛාත බව විසුද්ධිමග්ගයෙහි විවිධ න්‍යායන්ගෙන් විස්තර වේ. සතර පද ගාථාවක පළමු පාදය 'ආදිකල්‍යාණ'ය. දෙවැනි තෙවැනි පාදයෝ 'මජ්ඣේකල්‍යාණ'ය. සිවුවැනි පාදය 'පරියෝසානකල්‍යාණ'ය. ඒකානුසන්ධික සූත්‍රයක නිදානය 'ආදිකල්‍යාණ'ය. නිගමනය 'පරියෝසානකල්‍යාණ'ය. සෙස්ස 'මජ්ඣේකල්‍යාණ'ය. බොහෝ අනුසන්ධි ඇති සූත්‍රයක පළමු අනුසන්ධි ය 'ආදිකල්‍යාණ'ය. අවසාන අනුසන්ධිය 'පරියෝසානකල්‍යාණ'ය. මැද අනුසන්ධි 'මජ්ඣේකල්‍යාණ'ය. නිදාන උත්පත්ති සහිත බැවින් 'ආදිකල්‍යාණ'ය. හික්මවිය යුතු ජනයාට සුදුසු වන ලෙස අර්ථය විපරීත නොවන ලෙස දේශිත හේතු, උදාහරණ වලින් යුක්ත බැවින් 'මජ්ඣේකල්‍යාණ'ය. දේශනාව අවසානයේ ශ්‍රාවකයන් තුළ ශ්‍රද්ධාව ඇති වන බැවින් ද නිගමනයෙන් යුක්ත බැවින් ද 'පරියෝසානකල්‍යාණ'ය. මුළුමහත් ශාසන ධර්මයම තමාගේ යහපත පිණිස හේතු වන ශීලයෙන් යුක්ත බැවින් 'ආදිකල්‍යාණ'ය. සමථ - විදර්ශනා - මාර්ග - ඵල වලින් යුක්ත බැවින් 'මජ්ඣේකල්‍යාණ'ය. අවසානයේ නිවන් සාක්ෂාත් කරන බැවින් 'පරියෝසානකල්‍යාණ'ය. නැතහොත් සීල, සමාධි දෙක 'ආදිකල්‍යාණ'ය. විදර්ශනාව හා මාර්ගය 'මජ්ඣේකල්‍යාණ'ය. ඵල හා නිවන 'පරියෝසානකල්‍යාණ'ය. නැතහොත් බුද්ධසුබෝධිතාවයෙන් (ශාස්තෲන් වහන්සේ සර්වඥ බැවින්) 'ආදිකල්‍යාණ'ය. ධර්මසුධර්මත්වයෙන් 'මජ්ඣේකල්‍යාණ'ය. සංඝසුපටිපන්නතාවයෙන් 'පරියෝසානකල්‍යාණ'ය. පළමුවෙන් ධර්මය අසා අනතුරුව ඒ අනුව පිළිපැද සාක්ෂාත් කළ යුතු අභිසම්බෝධියෙන් යුක්ත වන බැවින් 'ආදිකල්‍යාණ'ය. පච්චේකබෝධියේ වශයෙන් 'මජ්ඣේකල්‍යාණ'ය. ශ්‍රාවකබෝධියේ වශයෙන් 'පරියෝසානකල්‍යාණ'ය. ධර්මය ශ්‍රවණය කරන විට නීවරණ ධර්මයන් සන්සිඳී යන බැවින් ධර්මය ඇසීම් පමණින්ම යහපත උදාවන බැවින් 'ආදිකල්‍යාණ'ය. ධර්මය පිළිපදින්නහුට සමථ - විදර්ශනා වශයෙන් මානසික සුවයෙන් යහපත සැලසෙන බැවින් 'මජ්ඣේකල්‍යාණ'ය. ප්‍රතිපදාව සම්පූර්ණ කිරීමෙන් උතුම් නිවන් සැප සැලසෙන බැවින් 'පරියෝසානකල්‍යාණ'ය. මෙසේ මුල - මැද - අග යහපත් බැවින් ශ්‍රී සද්ධර්මය ස්වාක්ඛාත නම් වේ.]

ලෝකෝත්තර ධර්මය වනාහි නිවන් අවබෝධ කිරීමට නිසි ප්‍රතිපදාවෙන් යුක්ත බැවින් ද එම ධර්මානුධර්ම ප්‍රතිපදාවට අනුරූප වූ නිර්වාණාවබෝධයෙන් යුක්ත බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වේ. කාමසුඛල්ලිකානුයෝග - අත්තකිලමතානුයෝග යන අන්ත ද්වයට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවෙන් ආර්ය මාර්ගය දේශිත බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම්. නිත්‍ය - මංගල - පරම - සුන්දර නිර්වාණ ධර්මය එනයින්ම වදාළ බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වේ. මෙසේ පර්යාප්ති ධර්මය මෙන්ම නව ලෝකෝත්තර ධර්මය ද ස්වාක්ඛාත වේ.

තවද, භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කරන කල්හි ශාසන බ්‍රහ්මචරියාව ද මාර්ග බ්‍රහ්මචරියාව ද නොයෙක් ආකාරයෙන් පැහැදිලි කරන සේක. එහිලා අර්ථ සම්පත්තියෙන් යුක්ත බව 'සාත්ථ' නම්. ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බව 'සව්‍යඤ්ජන' නම්.

සඞ්කාසන (සැකෙවින් කීම) - පකාසන (ප්‍රථමයෙන් කීම) - විවරණ (සැකෙවින් කීදේ විස්තර කිරීම) - විභජන (වරක් කී දේ නැවත කීම) - උත්තානීකරණ (විවරණය කළ දේ වඩාත් විස්තර කිරීම) - පඤ්ඤත්ති (විස්තර කරන ලද්ද නොයෙක් අයුරින් දක්වමින් ශ්‍රවණය කරන්නාගේ සතුට වැඩීම) යනාදි වශයෙන් අර්ථ පද සමායෝගයෙන් යුතු බැවින් 'සාත්ථ' නම්. අක්ඛර (පදයක අවයවය) - පද (විභක්ත්‍යන්ත පදය) - ව්‍යඤ්ජන (පද සමූහයකින් සෑදෙන වාක්‍යය) - ආකාර (වාක්‍යය නොයෙක් අයුරින් බෙදා දැක්වීම) - නිරුත්ති (අර්ථය ගෙන හැර කීම) - නිද්දේස (අර්ථය නිරවශේෂයෙන් දැක්වීම) යන ව්‍යඤ්ජන සම්පත්ති සහිත බැවින් සව්‍යඤ්ජන ය.

තවද අර්ථ ගම්භීර - ප්‍රතිවේද ගම්භීරතාවයෙන් යුතු බැවින් 'සාත්ථක' ය. ධර්ම ගම්භීර - දේශනා ගම්භීරතාවයෙන් යුතු බැවින් 'සව්‍යඤ්ජන'ය. අර්ථ පටිසම්පද - පටිභාන පටිසම්පදවන්ට අරමුණු වන බැවින් 'සාත්ථක'ය. ධම්ම පටිසම්පද - නිරුත්ති පටිසම්පදවන්ට අරමුණු වන බැවින් 'සව්‍යඤ්ජන'ය. නුවණැති ජනයා විසින් අවබෝධ කළ යුතු බැවින් ද විමර්ශනයේ යෙදෙන්නන්ට ප්‍රසාදය ගෙන දෙන බැවින් ද 'සාත්ථක'ය. ඇදහිය යුතු බැවින් ද ලෞකික ජනයාට ප්‍රසාදය ගෙන දෙන බැවින් ද 'සව්‍යඤ්ජන'ය. ගැඹුරු අදහස් ඇති බැවින් 'සාත්ථක'ය. නොගැඹුරු පද ඇති බැවින් 'සව්‍යඤ්ජන'ය. මෙසේ ධර්මය සාත්ථක හා සව්‍යඤ්ජන බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වේ.

ස්වාක්ඛාත ගුණයෙහිම තවත් අංගයක් නම් ශ්‍රී සද්ධර්මයෙහි තිබෙන මුළුමනින්ම පිරුණු (කෙවලපරිපුණ්ණ) බවයි. ධර්මයෙහි නොකියන ලද අමුතුවෙන් ඇතුළත් කළ යුතු අර්ථයක් නැති බවය, එයින් අදහස් කෙරෙනුයේ. එමෙන්ම ඉවත් කළ යුතු අපිරිසිදු යමක් නැති බැවින් නිර්දෝෂී බැවින් පරිසුද්ධ නම් වේ. මෙම ගුණයන්ගෙන් යුතු අධිශීල - අධිචිත්ත - අධිප්‍රඥ යන ත්‍රිශික්ෂාවෙන් යුතු ආර්ය මාර්ගය 'බ්‍රහ්මචරිය' නම් වේ.

තවද ශ්‍රී සද්ධර්මය වනාහි අවබෝධයට නිසි ගුණයෙන් යුතු බැවින් 'සාත්ථක'ය. පර්යාප්ති ධර්මය ආගම ව්‍යක්ත ගුණයෙන් යුතු බැවින් 'සව්‍යඤ්ජන'ය. සීලාදී ධර්ම ස්කන්ධ පසින් යුතු බැවින් මුළුමනින් සම්පූර්ණ ය. කෙලෙස් දුරු කරමින් සසරින් එතෙරවීම පිණිස පවතින බැවින් පිරිසිදුය. මෙබඳු ගුණයන්ගෙන් යුතුව සීල-සමාධි-ප්‍රඥා සංඛ්‍යාත මාර්ග බ්‍රහ්මචරියාව ප්‍රකාශිත බැවින් ද ධර්මය ස්වාක්ඛාත නම් වේ. අන්‍ය ආගම් දර්ශන විපරීත අර්ථයන්ගෙන් යුක්ත බැවින් දුරක්ඛාත ය. එහෙත් ශ්‍රී සද්ධර්මය වනාහි අර්ථ විපරීත බවකින් තොරවම සර්වඥයන් වහන්සේ විසින්ම දේශිත බැවින් ද <u>ස්වාක්ඛාත</u> නම් වේ.

ශ්‍රී සද්ධර්මයේ <u>ස්වාක්ඛාත</u> ගුණය විස්තර වශයෙන් මෙසේ අවබෝධ කරගත යුතු ය.

**2). <u>සන්දිට්ඨික</u> :-** තමන් විසින්ම මේ ජීවිතයේදීම ස්වසන්තානයෙන්ම ප්‍රත්‍යක්ෂ කළ යුතු බැවින් සන්දිට්ඨික නම් වේ.

✶ ආර්යයන් වහන්සේලා විසින් ස්වසන්තානගත රාගාදි කෙලෙසුන් දුරු කරමින්ම තමා විසින්ම ධර්මය අවබෝධ කරන බැවින් ද (සාමං දට්ඨබ්බෝ) ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික නම් වේ.

✶ මාර්ග සතරය, ඵල සතරය, 'නිවන' ය යන නව ලෝකෝත්තර ධර්මය අවබෝධ කර ගන්නා උතුමන් විසින් අනුන් අනුව ඇදහීමකින් තොරව තමාගේ ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන්ම එය දැන ගන්නා බැවින් ද (සයං දට්ඨබ්බෝ) ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික නම් වේ.

✶ ප්‍රශස්ත වූ දෘෂ්ටිය 'සන්දිට්ඨි' නම්. එම 'සන්දිට්ඨිය' කරණ කොට පස්මරුන් පරදවා ජය ලබන බැවින් නව ලෝකෝත්තර ධර්මය 'සන්දිට්ක' නම් වේ. මෙසේ සම්ප්‍රයුක්ත සන්දිට්ඨියෙන් යුතුව ආර්ය මාර්ගයෙන් කෙලෙස් නසා ජය ගනු ලැබේ. ඵලය පිණිස හේතු වූ සන්දිට්ඨියෙන් යුතුව ආර්ය ඵලයෙන් ද කෙලෙස් නසා ජය ගනු ලැබේ. නිවන අරමුණු කොට ඇති සන්දිට්ඨියෙන් යුතුව කෙලෙස් පරදවා ජය ලබන බැවින් නිවන ද 'සන්දිට්ඨික'ය. මෙසේ සන්දිට්ඨියෙන් යුතුව ජය ලබන බැවින් (සන්දිට්ඨියා ජයති) සන්දිට්ඨික නම් වේ.

✶ දර්ශනයට 'දිට්ඨ' යයි කියනු ලැබේ. මනාව දැකීමට යෝග්‍ය බව 'සන්දිට්ඨ' නම්. ලෝකෝත්තර මාර්ගය (සතර මාර්ග) දියුණු කර ගැනීම් (භාවනාභිසමය) වශයෙන් මනා දර්ශනයෙන් යුතු බැවින්, සසර බිය සන්සිඳේ. ඵල සතර හා නිවන ප්‍රත්‍යක්‍ෂකිරීම (සච්ඡිකිරියාභිසමය) වශයෙන් මනා දර්ශනයෙන් යුතු බැවින්, සියලු දුක් අවසන් වේ. මෙසේ මනා දර්ශනයට සුදුසු බැවින් සන්දිට්ඨික ය.

ශ්‍රී සද්ධර්මයේ <u>සන්දිට්ඨික</u> ගුණය මෙසේ අවබෝධ කරගත යුතු ය.

**3). <u>අකාලික</u> :-** කල් නොයවා විපාක දෙන බැවින් අකාලික නම් වේ. සෝතාපන්න, සකදාගාමී ආදී මාර්ග සිත් සතරට අනතුරුවම එහි ඵල සිත ද ලැබේ. මෙය ලෝකෝත්තර ධර්මයන්ටම විශේෂිත වූ ධර්මතාවයකි. ලෞකික කුසල ධර්මයන්හි විපාක ලැබීමට යම් කිසි කාලයක් ගත වේ. එහෙත් ලෝකෝත්තර මාර්ගයන් පිළිබඳව එසේ නොවී මාර්ගයට අනතුරුවම (සමනන්තර) ඵලය ලැබෙන බැවින් එය <u>අකාලික</u> නම් වේ.

**4). <u>ඒහිපස්සික</u> :-** 'පැමිණ මෙම ධර්මතාවය නුවණින් දකින්නැ'යි කීමට සුදුසු බැවින් ශ්‍රී සද්ධර්මය 'ඒහිපස්සික' නම් වේ. මේ ශ්‍රී සද්ධර්මය 'පැමිණ බලන්නැ'යි කියන විධානයට සුදුසු වන්නේ කුමක් නිසා ද? ලෝකෝත්තර ධර්මයන්ගේ තිබෙන විද්‍යාමානත්වය හා පිරිසිදු බව නිසා ය. හිස් අත මිට් මොලවා ගෙන 'පැමිණ රන් බලන්නැ'යි කිව නොහැක. (මිටෙහි කිසිවක් නැති බැවිනි.) අශුචි මල මූත්‍ර බඳු දෙයක් විද්‍යමාන වුව ද පැමිණ බලන්නැයි කිව නොහැක. (එය අන්‍යයන්ට නොපෙනෙන සේ වසා දැමිය යුතු අපිරිසිදු දෙයක් බැවිනි.)

එහෙත් මෙම නව ලෝකෝත්තර ධර්මය වනාහි වලාකුළු පහවූ අහසෙහි බබළන පුන් සඳ මඬල මෙන් විද්‍යාමානය. රත්පලසක් මත තැබූ ජාතිරංග මාණික්‍යයක් මෙන් පිරිසිදු ය. මෙසේ

විද්‍යමාන බැවින් ද පිරිසිදු බැවින් ද යුතු වූ නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඒහිපස්සික ගුණයෙන් යුතු ය.

**5). ඕපනයික :-** සිතෙහි පිහිටුවා ගැනීමට සුදුසු බැවින් ද නිවන කරා පමුණුවන බැවින් ද ඕපනයික නම් වේ.

තම හිසට හෝ ඇඳි වතට හෝ ගිනි ඇවිළුණ ද ඒ ගැන නොතකා භාවනා වශයෙන් සතර මාර්ග - ඵල ධර්මයන් සිතෙහි පහළ කර ගැනීම, අවබෝධ කර ගැනීම කළ යුතු බැවින් ලෝකෝත්තර ධර්මය 'උපනෙතබ්බ' අර්ථයෙන් ඕපනයික නම් වේ. අසංඛත වූ නිවන වනාහි තම සිතින් අරමුණු කිරීම් වශයෙන් එය කරා පැමිණීමට සුදුසු බැවින් 'උපනයන' අර්ථයෙන් ඕපනයික නම් වේ. තව ද ආර්ය පුද්ගලයන් නිවන කරා පමුණුවන බැවින් ලෝකෝත්තර ආර්ය මාර්ගය 'උපනෙය්‍ය' අර්ථයෙන් ඕපනයික නම් වේ. ආර්ය පුද්ගලයන් විසින් ප්‍රත්‍යක්ෂ කළ යුතු බවට පැමිණ විය යුතු බැවින් ඵල ධර්මයන් හා නිවන උපනෙය්‍ය අර්ථයෙන් ඕපනයික නම් වේ. මෙසේ නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඕපනයික නම් වේ.

**6). පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි :-** නුවණැත්තන් විසින් තම තමාගේ නුවණින්ම අවබෝධ කළ යුතු බැවින් 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' නම් වේ. ශ්‍රී සද්ධර්මය වනාහි උග්ඝටිතඤ්ඤූ ආදී පුද්ගලයන් විසින් 'මා විසින් මාර්ගය වඩන ලදී. ඵලය ලබන ලදී. නිවන ප්‍රත්‍යක්ෂ කරන ලදී' යනුවෙන් තමා තුළින්ම ප්‍රත්‍යක්ෂ කළ යුතු දහමකි. මාර්ග - ඵල - නිර්වාණ ධර්මයන් වනාහි අනුන් පැළඳි ආභරණයක් සේ සැමටම පොදුවේ දැක ගන්නට නොලැබෙන තම තමන් විසින්ම තමා සඳහා ප්‍රත්‍යක්ෂ කළ යුතු ධර්මයෝ ය. ආචාර්වරයා ප්‍රත්‍යක්ෂ කළ නිවනින් කිසිවිටක ශිෂ්‍යාගේ සන්තානගත කෙලෙස් ප්‍රහානය නොවේ. තවද මෙම ශ්‍රී සද්ධර්මය අඥානයන්ට විෂය නොවන නුවණැත්තන්ටම ප්‍රඥාගෝචර වන දහමක් බැවින් ද 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' නම් වේ.

මෙසේ දහම් ගුණ නැවත නැවතත් සිහි කරන විට එම සන්තානයේ රාග - ද්වේෂ - මෝහාදී අකුසල ධර්මයන් සන්සිඳී යයි. (අනුසය ධර්මයන් ඒ මොහොතෙහි නැඟී නොඑයි.) දහම් ගුණ අරමුණු කරගෙන සිත ඍජුවම එදෙසට යොමුව එකඟව පවතී. මෙසේ පඤ්චනීවරණ විශ්කම්භනය වී යාමෙන් විතක්ක - විචාරාදි පඤ්ච ධ්‍යානාංගයන්ගේ පහළ වීමෙන් උපචාර සමාධියට පත්විය හැකිය. දහම් ගුණයන්ගේ ගම්භීරත්වය නිසා ද අනේක වූ දහම් ගුණ සිහිකිරීමේ යෙදී සිටින නිසා ද උපචාර ධ්‍යානය ඉක්මවා අර්පණා තත්වයට පත්වීමක් ධම්මානුස්සති භාවනාවෙන් සිදු නොවේ.

**අනුසස් :-** ධම්මානුස්සති භාවනාව වඩන යෝගාවචරයා ශාස්තෘන් වහන්සේ කෙරෙහි බලවත් ගෞරවයෙන් යුතුව යටහත් පැවතුම් ඇතිව වාසය කරයි. ධර්ම රත්නය කෙරෙහි ද ගෞරවයෙන් යුතුව බලවත් ශ්‍රද්ධාවක් ඇතිකර ගනී. නිතර ප්‍රීති ප්‍රමෝද බහුලව වාසය කරයි. බිය ජනක අරමුණු ඉවසීමට සමත් වේ. දුක් වේදනා ඉවසීමට සමත් වේ. ධර්මය සමඟින් එක්ව විසීමේ සංඥාව ලබයි. නිතර ධම්මානුස්සතිය වඩන යෝගාවචරයාගේ ශරීරය ද චෛත්‍යගෘහයක් සේ පූජනීය වේ. අනුත්තර වූ ලෝකෝත්තර ධර්ම සාක්ෂාත් කිරීමට සිත නැමේ. ශික්ෂා පද කඩ කිරීම් ආදී කරුණක් එළැඹි කල්හි ධර්මසුධර්මත්වය සිහි කිරීම තුළින් වහා හිරි ඔතප් ඇතිවීමෙන් එම වරදින් වළකී. මේ ජීවිතය තුළ අර්හත්වයට පත් නොවී නම් ධම්මානුස්සති භාවනාමය කුසලයෙන් නිසැකයෙන්ම සුගති ගාමී වේ.

## ධම්මානුස්සතියෙන් විදර්ශනාවට

ධම්මානුස්සති භාවනාව වැඩීමේදී පහළ වූ නාම - රූප ධර්මයන් ක්ෂණයක් පාසා ඇතිව - නැතිව ගිය බැවින් අනිත්‍ය ය. ඇතිවීම් - නැතිවීම් වශයෙන් නිරන්තරයෙන් පීඩාකාරී වූ නාම-රූප දුකට අයත් ය. තමාගේ වසඟයෙහි නොපවතින එම නාම-රූප අනාත්ම ය. අනිත්‍ය වූ දුක් වූ අනාත්ම වූ එම නාම රූප ධර්මයන් දුක්ඛ සත්‍යය ය. එම නාම-රූප හට ගැනීමට හේතු වූ පූර්ව භව තණ්හාව සමුදය සත්‍යය යි. එම දුක්ඛ - සමුදය දෙකෙහි නොපැවැත්ම වූ නිවන නිරෝධ සත්‍යය ය. ඒ නිරෝධය සාක්ෂාත් කිරීම සඳහා වැඩිය යුතු ප්‍රතිපත්ති මාර්ගය, මාර්ග සත්‍යය ය.

මෙසේ අනේකානිසංස ඇත්තා වූ ධම්මානුස්සති භාවනාව වඩා වහා නිර්වාණාවබෝධ කිරීමට සත්පුරුෂයෝ වෑයම් කරත්වා.

**සාධු ! සාධු !! සාධු !!!**

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
**(2549 වෙසක්)**


ආශ්‍රිත ග්‍රන්ථ -
විසුද්ධිමග්ග
දහම් ගුණ භාවනාව - අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍දයන් වහන්සේ.



✍ *පසුගිය ධර්ම පත්‍රිකා* **www.sadaham.eartefacts.com** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකිය.*

✍ **Copyright © Sri Saddharmma Sansadaya, Dhammarama Yogashramaya. 2005**